# ශ්‍රී ලාංකේය බුදු දහම කෙරෙහි හින්දු ආගමේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක් ඃ අනුරාධපුර හා පොළොන්නරු යුගවලට විශේෂිතව

*දිසානායක, ඩී. එස්. පී. [1] සහ සිරිවර්ධන, ඒ. පී. ටී. එම්. [2]*

ශ්‍රී ලංකාව ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටම විවිධාකාර වූ ඇදහිලිවලට යොමු වූ ජන කොට්ඨාස ජීවත් වූ රටක් ලෙස ප්‍රචලිතය. මෙයින් ඇතැම් ඇදහිලි ලංකාවට ගෙන එන ලද්දේ ආර්යයන් විසින් යයි සිතිය හැක්කේ භාරතයෙහිද එබඳු ඇදහිලි තිබුණ බවට සාක්ෂි ඇති බැවිනි. ඒ අනුව ශ්‍රී ලාංකේය බුදු දහම මත හින්දු ආගමික බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම, මෙම පර්යේෂණයේ අරමුණ වේ. මධ්‍යම ප්‍රතිපදාව නැමැති ආගමික පිළිවෙත බුදු දහමෙහි නිර්වාණය සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාමාර්ගයයි. සදාචාරවාදී අවධාරණයක් සහිත ආගමික නැඹුරුවක් මගින් ප්‍රඥාව අගයන තර්ක-විතර්ක පිළිබඳ දාර්ශනික විග්‍රහයක් බුදු දහමේ අන්තර්ගතය. හින්දු ආගම, ලෝකය පිළිබඳ පුළුල් න්‍යායකින් හෙබි ජීවිත දර්ශනයකි. බුදු දහම සහ හින්දු ආගම හා සම්බන්ධ විචාර කෘති කිහිපයක් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ලෙස ගෙන මෙම අධ්‍යයනය සිදු කෙරේ. මූලාශ්‍රය විග්‍රහ කර බැලීමේදී ශ්‍රී ලාංකේය බෞද්ධ ආගම හුදු ධර්මයක් පමණක් නොව ඉන්දීය සංස්කෘතිය හා සභ්‍යත්වයෙන් ඔප වැටුණු ජීවන පිළිවෙතක් බව අවිවාදිතය.

**ප්‍රමුඛ පදඃ** බුදු දහම, හින්දු ආගම, ඉන්දීය සභ්‍යත්වය, ඉන්දීය සංස්කෘතිය

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර ජන සන්නිවේදන අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*sanikapriyanjali@gmail.com*
[2]*ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, ජන සන්නිවේදන අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*thilinimsiriwardhana@gmail.com*